රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 16/2020

මගේ අංකය : Pns/P7/17
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2020.06.26

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ත්‍රිවිධ හමුදාපතිවරුන්

## වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන අවස්ථාවක විශ්‍රාම ගන්වන දිනය තීරණය කිරීම

විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.14 වගන්තිය යටතේ වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන අවස්ථාවක, නිලධරයා විශ්‍රාම ගන්වන දිනය තීරණය කිරීමේ දී මින් ඉදිරියට පහත උපදෙස් අනුගමනය කළ යුතු වේ.

02. නිලධරයා වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දිනය පදනම් කරගෙන විශ්‍රාම ගැන්විය යුතු දිනය පහත සඳහන් පරිදි තීරණය කළ යුතු ය;

(අ) එම නිලධරයා වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දිනයට පසුව ද සේවයට වාර්තා කර ඇත්නම් අවසන් වරට සේවයට වාර්තා කළ දිනයේ සිට විශ්‍රාම ගැන්විය යුතු ය.

(ආ) නිලධරයා අවසන් වරට සේවයට වාර්තා කළ දිනයට පසු දිනයක එම නිලධරයා වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත්නම්, අවසන් වරට සේවයට වාර්තා කළ දිනයේ සිට වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දිනය දක්වා නිලධරයාට හිමි නිවාඩු ලබා දීමෙන් පසු ඉතිරි කාලසීමාව වැටුප් රහිත කාලයක් ලෙස සළකා වෛද්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කළ දිනයේ සිට විශ්‍රාම ගැන්විය යුතු ය.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් -

| | | | |
|---|---|---|---|
| 01. | ජනාධිපති ලේකම් | - | කාරුණික දැන ගැනීම සඳහා |
| 02. | අග්‍රාමාත්‍ය ලේකම් | - | කාරුණික දැන ගැනීම සඳහා |
| 03. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව | - | කාරුණික දැන ගැනීම සඳහා |
| 04. | ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | - | කාරුණික දැන ගැනීම සඳහා |
| 05. | විගණකාධිපති | - | අවශ්‍ය කටයුතු සඳහා |